**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2024**

**--------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | | අධිකාරියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ. | | |
| | (i) | රු. 1,647,054 ක අසම්භාව්‍ය බැරකම් වෙන්කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දෙවරක් ගලපා තිබීම. | මෙම වරද ඇති නොවන ආකාරයට 2025 වසරේ සිට නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව ගැළපිය යුතුය. |
| | (ii) | අධිකාරියට ප්‍රදානයක් ලෙස ලැබූ ආදායම් ලෙස ගිණුම් තබා තිබුණු රු.1,400,000 ක් වටිනා මෝටර් රථය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී අඩුකර නොතිබීම. | 2025 වසරේ සිට නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව ගැළපිය යුතුය. |
| | (iii) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී මුදලින් කරන ලද රු.85,970,456 ක ආයෝජන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබීම. | වරද නිවැරදි කර 2025 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව ගැළපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම රු.89,710,739 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.564,621,668 ක් ලෙස දක්වා තිබීම. | මෙම වරද ඇති නොවන ආකාරයට 2025 වසරේ සිට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ නිවැරදිව ගැළපිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 54 ප්‍රකාරව එකම පන්තියට අයත් වත්කම් ප්‍රත්‍යාගණනයෙන් හටගන්නා ලාභ අලාභ හිලව් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර හා උපකරණ ප්‍රත්‍යාගණනයෙන් සිදු වූ අලාභය රු. 659,672 ක් ප්‍රත්‍යාගණනයෙන් සිදු වූ ලාභයට හිලව් නොකර වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මෙම වරද ජර්නල් සටහන් අංක මගින් වර්ෂයේදී නිවැරදි කර 2025 .ඇත | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 132 ඡේදය අනුව අස්තිත්වයක් විසින් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු බව සඳහන් වුවත් අධිකාරියේ ආදායම් සම්බන්ධයෙන් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය වෙනුවෙන් ඉතිරිකරගත් නිවාඩු සඳහා ගෙවන ලද රු. 1,195,295 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | ඉතිරි කරගත් නිවාඩුව මත ප්‍රතිලාභය ගෙවීමට සිදුවන්නේ ඉදිරි වර්ෂයේදී බැවින් ඒ අනුව ඉතිරි කරගත් නිවාඩු මත දීමනාව එළඹෙන අයවැයට ඇතුළත් කර ඇත. 2025 සංශෝධිත අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී මෙම වියදම අදාළ වර්ෂයටම ගැළපීමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වියදම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අසම්භාව්‍ය බැරකම් ගණනය කිරීමේදී සේවය අත්හිටුවා තිබූ සේවකයින් සඳහා රු. 785,783 ක හිඟ වැටුප් හා දිරිදීමනා අසම්භාව්‍ය බැරකම් යටතේ ගිණුම්ගත නොකිරීමෙන් අසම්භාව්‍ය බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අසම්භාව්‍ය බැරකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.10,661,760 ක ණයගැති ශේෂයෙන් රු.9,450,486 ක් වර්ෂ 05 ඉක්ම වූ ණයගැති ශේෂ වන අතර එහි අධිකාරියේ විෂය පථයට අයත් නොවන කාර්යයන් වන මීගමුව හා ගම්පහ රෝහල් වල පොම්පාගාර නඩත්තු කිරීම වෙනුවෙන් අයවිය යුතු පිළිවෙලින් රු 5,940,769ක් හා රු.421,634 ක් ඇතුළත් වී තිබුණි. | මීගමුව රෝහලෙන් ලැබිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමිය විසින් කමිටුවක් පත්කර ඇති අතර කමිටු වාර්තාව අනුව ඉදිරි පියවර ගැනීමට නියමිතය.<br>සමථකරණය සඳහා ලැබිය යුතු බවට පොත් වල පෙන්නුම් කරනු ලබන වටිනාකම පොත් වලින් කපා හැරීම සඳහා පත්කළ කමිටු වාර්තාව අනුව ඉදිරි පියවරයන් ගැනීමට නියමිතය .<br>ජල්තර රජයේ නිවාස ක්‍රමයේ පදිංචිකරුවන්ගෙන් අයවිය යුතු මුදල ඒකාබද්ධ කළමනාකරණ සංස්ථාව පිහිට වූ පසු අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ නිලධාරීන් තිදෙනෙකුගේ සේවය හැරයාම නිසා ඔවුන්ට ලබාදුන් රු. 685,766 ක් වූ කාර්ය මණ්ඩල ණය නැවත අයකරගෙන නොතිබුණි. | මෙම කාර්ය මණ්ඩල ණය ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇති අතර ඒ සඳහා ලැබෙන ප්‍රතිචාර අනුව නීති කටයුතු වලට යොමු වීමට නියමිතව ඇත. | ණය ශේෂ නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 21,414,931 ක විවිධ ණයහිමි ශේෂය තුළ වර්ෂ 05 ඉක්මවූ රු.13,660,874 ක ශේෂයක්ද පැවති අතර එම ශේෂ මේ දක්වා නිරවුල් කර නොතිබුණි | ඒකාබද්ධ කළමනාකරණ සංස්ථාව සක්‍රීය කිරීමෙන් පසු අදාළ මුදල ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ඇත. | ණයහිමි ශේෂයන් නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ 5(2) වගන්තිය | සහාධිපත්‍ය දේපලක පදිංචි වීම සඳහා අනුකූලතා සහතික හා අවසන් සහතික ලබාගතයුතු වුවත් එසේ ලබානොගෙන හිමිකරුවන් 699 දෙනෙකු පදිංචි වී තිබීම නිසා සංස්ථා පිහිටුවීමට හා ඔප්පු ප්‍රදානයට නොහැකි වී තිබුණි. එමනිසා නඩත්තු කටයුතු හා නිවාස දේපල හිමියන්ගේ ගැටළු සම්බන්ධයෙන් අධිකාරියට ක්‍රියාකිරීමට නොහැකි වී තිබුණි. | මෙහි සඳහන් ආකාරයට නඩත්තු කටයුතු සහ ඔප්පු ප්‍රදානය කිරීමට නොහැකි වී ඇත්තේ අවසන් සහතික ලබා නොගැනීමේ හේතුව නිසා පමණි. එහෙත් අධිකාරියේ අවසාන සහතිකය ලබාගැනිමට හැකිවනුයේ එම දේපල සඳහා අනුකූලතා ලබාදීමෙන් අනතුරුවය. ඒ පිළිබඳව සංවර්ධනකරුවන් පසු විපරම් ක්‍රියාවලියේදී දැනුවත් කර ඇත. | අනුකූලතා සහතිකය සහ අවසන් සහතිකය ලබාදීමෙන් පසු සහාධිපත්‍ය දේපල තුළ හිමිකරුවන්ට පදිංචිවීමට අවසර දිය යුතුය. |
| (ආ) | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 05 ඡේදයේ (ඌ) වගන්තිය | මාලිගාවත්ත හා ජල්තර නිවාස වල නඩත්තු කිරීම පලාත් පාලන ආයතන වෙත පැවරිය යුතු වුවත් එසේ නොකිරීමෙන් ජල්තර නිවාස ක්‍රමයේ අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ යෝජනා ක්‍රමයේ උපාංග විනාශ කිරීම නිසා ප්‍රදේශය පුරා දුර්ගන්ධයක් පැවතීම හා අපජලය පරිසරයට මුදා හැරීමෙන් පොදු ජල පද්ධතියට එක්වීම හේතුවෙන් ජනතාවට සෞඛ්‍ය බලපෑම් ඇතිවිය හැකිය. එසේම අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පාරසරික ආරක්‍ෂන බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි. | මාලිගාවත්ත නිවාස ක්‍රමයේ පොදු ප්‍රවේශමාර්ග හා අංගෝපාංග දේපල තවමත් සංවර්ධනකරුවන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව පවතී. පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වන්නේ මෙම සහාධිපත්‍ය දේපළ දෙකෙහිම සංවර්ධනකරු වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වනු ඇත. | සංවර්ධනකරුට පාරසරික ආරක්‍ෂන බලපත්‍රයක් කඩිනමින් ලබාගන්නා ලෙස දැනුම්දිය යුතු අතර ජනතාවගේ සෞඛ්‍යට අහිතකර බලපෑම් ඇති නොවන ආකාරයට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | අධිකාරිය විසින් පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ හා තෘතිය මට්ටමේ තනතුරු 06 ක් සඳහා වර්ෂයකට වඩා වැඩි කාලයක් වැඩබැලීමේ පත්වීම් සිදුකරමින් තිබුණි. | 2024 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර, එකී තනතුරුවලට අදාළව සුදුසුකම් ලත් අයදුම්කරුවන් නොසිටීම නිසා අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යොමුකර ඇති බැවින් එතෙක් අත්‍යාවශ්‍ය තනතුරු කිහිපයක් සඳහා සේවා අවශ්‍යතාවය මත පත්වීම් බලධරයා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව වැඩ බැලීමේ තනතුරු කිහිපයක් ලබා දී ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව අත්‍යවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් ස්ථිරව පත්කර අධිකාරියේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති ආයතනික යහ පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර සඳහා ඒ ඒ ආයතනවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ආර්ථික ප්‍රතිපත්තියට ගැලපෙන පරිදි උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කළයුතු වුවද ව්‍යාපාරික පරිසරයේ සිදුවෙන වෙනස්වීම් සඳහා අධිකාරිය විසින් උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2025 - 2029 උපායමාර්ගික සැලැස්ම නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත යොමු කර ඇත. | උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අධිකාරියේ සේවකයින් හට සාමාන්‍ය ආපදා ණය ක්‍රමයට අමතරව තවත් විශේෂ ආපදා ණය මුදලක් රු.30,000 ක උපරිමයකට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත පමණක් ගෙවා තිබුණි. සාමාන්‍ය ආපදා ණය ශේෂය හා මෙම විශේෂ ආපදා ණය එක්ව ගත්කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 හි පවතින උපරිම සීමාවා ඉක්මවා ගොස් තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර වැඩිපුර ගෙවීම් අය කිරීමට හා ඉදිරියේදී අදාළ සිද්ධීන් ඇති නොවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශ හෝ ආයතන මට්ටමෙන් සිදුකරනු ලබන විවිධ දීමනා ගෙවීම් අත්හිටුවීම හා විවිධ සුබසාධන සහනාධාර හා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් නව | අධිකාරියේ සමස්ථ සේවක සංඛ්‍යාව 137 ක් වුවත් තත්‍ය සේවක සංඛ්‍යාව 89 ක් පමණ වන බැවින් අවම සේවක සංඛ්‍යාවක් තුළින් අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම සේවාවක් ලබා | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර අනුමත නොවන ගෙවීම් අය කළ යුතුය. |

| | |
|---|---|
| බැදීම් ඇති කර නොගත යුතු වුවද අධිකාරිය විසින් සමස්ථ කාර්ය මණ්ඩලයට මාසිකව රු. 6,500 බැගින් එලදායිතා දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන සමාලෝචිත වර්ෂයේ දී රු.4,673,100 ක් ගෙවා තිබුණි. | ගන්නා බැවින් අධිකාරියේ සමස්ථ සේවක ඉල්ලීම පදනම් කර ගෙන වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර සේවකයන්ගේ පැමිණීමද පදනම් කර ගනිමින් එලදායිතා දීමනාව ලෙස රු.6,500 ක දීමනාව ගෙවීම් කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 85,051,178 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 154,849,367 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,798,189ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට මෙහෙයුම් නොවන ආදායම රු.76,599,246 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු. 20,475,338 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

(අ) 2024 වර්ෂයේ මෙහෙයුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. 22,711,658 කින් වැඩි වුවද මෙහෙයුම් නොවන ආදායම් රු. 76,599,246 කින් අඩුවී තිබුණි.

(ආ) 2024 වර්ෂයේ සේවක වැටුප් හා වෙනත් මෙහෙයුම් වියදම් පිළිවෙලින් රු. 16,481,129 කින් හා රු. 5,079,919 කින් ඉහළ ගොස් තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය 0.6:1ක් වූ අතර පසුගිය වර්ෂයේ දී එය 1.2:1 විය. මේ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ද්‍රවශීලතාවය පහළ මට්ටමක පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය වෙත ලැබී තිබුණු පැමිණිලි වලින් 55 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර මෙයින් පැමිණිලි 04 ක් ලැබී වසර 07 කට වැඩි කාලයක්ද, පැමිණිලි 15 ක් ලැබී වසර 03-07 ත් අතර කාලයක්ද, පැමිණිලි 22 ක් ලැබී වසර 01-03 ත් අතර කාලයක් ගත වී තිබුණි. මෙම පැමිණිලි අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 20 ක්, ජල කාන්දුවීම් සම්බන්ධ පැමිණිලි 10 ක් හා දේපල පිඹුරු ලියාපදිංචි නොකිරීම සම්බන්ධ පැමිණිලි 14 ක් ද විය. | පරීක්ෂණ මෙහෙයවන නිලධාරීට පනතේ හා පොදු නීතියේද ප්‍රතිපාදන සලකා බලමින් නිවැරදිව අවශ්‍ය සාක්ෂි හා ලේඛන ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන අතරම ඒ මත පදනම්ව නිවැරදි තීරණයක් ලබාදීමට කටයුතු කෙරේ. එමගින් නිසි පරිදි කරුණු සොයා බැලීමට හා විරෝධතා සලකා බැලීමටද කාලයක් ගත වනු ඇත. | පැමිණිලි විභාග කිරීමට කඩිනමින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර නොමැති රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සංවර්ධනකරුවන් 09 කට එරෙහිව පරීක්ෂණයක් පවත්වා නීතිය මගින් කටයුතු කිරීමට අපේක්‍ෂා කළද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉන් 03 ක් පමණක් එනම් සියයට 33 ක් පමණක් ඉටු කිරීමට හැකිව තිබුණි. | සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කර නොමැති දේපළවල පරීක්ෂණ පවත්වන්නේ එකී සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට දේපල සංවර්ධනකරුට අවස්ථාව ලබාදීම සඳහාය. ඉන්පසුව සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීම සඳහා උනන්දු නොදක්වන්නේනම් එකී දේපල සම්බන්ධව නඩු පැවරීම සිදු කරනු ලබයි. ඒ සඳහා කරුණු සොයා බැලීමට කාලයක් ගතවීමට ඉඩකඩ ඇත. | ඉලක්කගත පරිදි පරීක්‍ෂණ පවත්වා නෛතික ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කළ දින සිට මාස 03 ක් ඇතුළත කළමනාකරණ සංස්ථා පිහිටුවීම සිදුකළ යුතු වුවත් 2024 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා 04 ක් හා පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා 35 ක් පිහිටුවීමට ඉලක්ක කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයේදී රාජ්‍ය අංශයේ එක් කළමනාකරණ සංස්ථාවක් හෝ පිහිටුවා නොතිබුණු අතර පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා 03 ක් පමණක් පිහිටුවා තිබුණි. එහි ප්‍රගතියද සියයට 9 ක් විය. | සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කර නොමැති දේපළවල පරීක්ෂණ පවත්වන්නේ එකී සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට දේපල සංවර්ධනකරුට අවස්ථාව ලබාදීම සඳහාය. ඉන්පසුව සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීම සඳහා උනන්දු නොදක්වන්නේනම් එකී දේපල සම්බන්ධව නඩු පැවරීම සිදු කරනු ලබයි. ඒ සඳහා කරුණු සොයා බැලීමට කාලයක් ගතවීමට ඉඩකඩ ඇත. | ඉලක්කගත පරිදි කළමනාකරණ සංස්ථා පිහිටුවා අදාළ කාර්ය ඉටු කරගැනීමට අධිකාරිය විසින් අවශ්‍ය මෙහෙයවීම් සිදු කළ යුතුය. |
| (ඈ) | සහතිකපත් හා මුලික නිෂ්කාශන ලිපි අලුත් කිරීම සම්බන්ධයෙන් මුලික නිෂ්කාශන ලිපිගොනු 13 ක්, තාවකාලික සභාධිපත්‍ය ලිපිගොනු 72 ක් හා අර්ධ සභාධිපත්‍ය ලිපිගොනු 35 ක් අලුත්කිරීමට ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේදී අලුත්කිරීම් 14 ක් පමණක් එනම් සියයට 12 ක ඉලක්කගත ප්‍රමාණයක් පමණක් ලගා කරගෙන තිබුණි. | මෙහි සඳහන් අර්ධ සහ තාවකාලික දේපල සඳහා සංවර්ධන කරුවන් දැනුවත් කර ඇතත් ඔවුන් විසින් අලුත් කිරීම සඳහා ඉල්ලුම් කර නොමැත. | ඉලක්කයන් හැකිතාක් නිවැරදිව හා තාත්විකව සැලසුම් කිරීමට හා අධිකාරියේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කාලීන අවශ්‍යතාවය මත වර්ෂය තුල නව රෙගුලාසි 03 ක් සකස් කිරීම, කෙටුම්පත් කිරීම හා ගැසට් කිරීමට අපේක්‍ෂා කළ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු නව රෙගුලාසියක් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි. | එක් එක් අංශ වලින් පනත් සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා සියල්ලම වෙන් වෙන් වශයෙන් ලේඛන ගත යුතු අතර ඒවා තෝරාගත් සමීක්ෂණ මණ්ඩලයක් මඟින් කරුණු විශ්ලේෂණය කර අනුකූල කරුණු මොනවාද යන්න සොයා බැලිය යුතුය. ඉන් පසුව ඒවා ගැසට් කිරීමට කටයුතු *කළ යුතුය.* මේ සඳහාද යම් කිසි කාලයක් ගතවීම නොවැළැක්විය හැකිය. | රෙගුලාසි හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සහතික පත් අංශයේ ලේඛන ඩිජිටල් කිරීම සඳහා ලේඛන කළමනාකරණ පද්ධතියක් | සහතිකපත් අංශයේ 2005-2023 දක්වා වූ ලේඛණ පර්යාලෝකණය කර අදියර වශයෙන් ලේඛණ කළමනාකරණ | පර්යාලෝකනය කිරීම කඩිනමින් සිදුකර එම |

| | | |
|---|---|---|
| ස්ථාපිත කිරීමට රු. මිලියන 5.9 ක මුදලක් ප්‍රවර්තන වර්ෂයේදී වියදම් කොට තිබුණද එම පද්ධතිය ප්‍රයෝගිකව භාවිතා කළ හැකි පරිදි යොදාගෙන නොතිබුණි. | පද්ධතිය තුල ස්ථාපනය සිදුකෙරෙනු ඇත. 2025.05.22 දින වන විට ලේඛණ 205,889 පර්යාලෝකනය කර ඇත. | පද්ධතිය ප්‍රයෝගිකව අධිකාරියේ භාවිතයට ගතයුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් වසර 17 ක කාලයක් පුරා ස්ථිර කාර්ය මණ්ඩලය පත්නොකර නීති උපදේශක හා පරීක්ෂණ නිලධාරි නමින් තාවකාලික පදනම මත බඳවාගෙන 2024 වර්ෂයේ දී රු. 2,242,218 ක් හා බාහිර පාර්ශවයන් වෙත නීති ගාස්තු ලෙස රු. 916,500 ක් ගෙවීම් කර තිබුණි. | දින පුවත්පත් 21 ජනවාරි 2024 දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ අනුමැතිය ලැබී .පවත්වන ලදී තිබුණේ එක් පුරප්පාඩුවක් පිරවීමට පමණි. අවම සුදුසුකම් සහිත ආධුනික නීතිඥවරයෙකු සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නීති අංශයේ ප්‍රධානියා ලෙස බඳවා ගැනීම ගැටලු සහගත තත්වයක් විය හැකි බැවින් තනතුර සඳහා පත් කළ නොහැකි බව අධිකාරියේ පත්වීම් බලධරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම නිසා එම පුරප්පාඩුව පිරවීමට නොහැකි වීමෙන් නීති උපදේශක සේවාව තවදුරටත් ලබාගැනීම සිදුකර ඇත. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | අනුමත තනතුරක් නොමැති බලයලත් මිනින්දෝරු ලෙස 2021 ඔක්තෝබර් 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වසර 03 කට අධික කාලයක් සේවා දිගු ලබාගනිමින් රාජකාරී අවශ්‍යතාවය අනුව වැඩ පැවරීමේ පදනම මත නිලධාරියෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී ද රු.603,300 ක් ගෙවීම් කර තිබුණි. | බලයලත් මිනින්දෝරු තනතුරක් අප අධිකාරියේ නොමැති අතර නියාමන කටයුතු කිරීමේදී ගොඩනැගිලි සැලැස්ම හා සභාධිපත්‍ය පිඹුර සසඳා එකිනෙක විශ්ලේෂණය කිරීම සඳහා වෘත්තීමය හැකියාව ඇති බලයලත් මිනින්දෝරුවරයකු අවශ්‍ය බව තහවුරු වියතවද . අප අධිකාරියේ බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධන ඉදිරියේදී සිදුකිරීමට බලාපොරොත්තු වන අතර එහිදී අදාළ තනතුර ඇතුළත් කිරීමට බලාපොරොත්තු වනු ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමට කටයුතු කර අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් කඩිනමන් කළ යුතුය. |
| (ඇ) | අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 137 ක් වුවද සමාලෝචිත | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමට කටයුතු |

වර්ෂය අවසානයේදී එහි තත්‍ය තනතුරු සංඛ්‍යාව 89 ක් විය. ඒ අනුව අදාළ තනතුරු වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව යාවත්කාලීන කිරීමක් සිදුනොකර පැවති අතර තනතුරු 48 ක් පුරප්පාඩු පැවතුණි. ඉන් 08 ක් ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු වී තිබුණි.

අනුමැතිය ලබා ගැනීම සඳහා යොමුකර ඇත . තාවයන්ට අනුකූලව අවශ්‍ය ඉදිරියේදී අධිකාරියේ බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධන සිදු කිරීමට නියමිතව ඇත.

කර අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් කඩිනමන් කළ යුතුය.